# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1765/19 - 2012 ජුලි මස 06 වැනි සිකුරාදා - 2012.07.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත

10අ(1)(අ) වැනි වගන්තිය යටතේ දැන්වීම

**පානදුර ප්‍රාදේශීය සභාව**

පානදුර ප්‍රාදේශීය සභාවේ සභිකයකු වන එච්. ජගත් පුෂ්ප කුමාර පෙරේරා මහතා, ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයේ සාමාජිකයකුව සිටීම අවසන් කර ඇති නිසා, එම සභාවේ ඔහුගේ සභික ධූරය ඔහු විසින් අත හැර ඇති බව පානදුර ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි හැන්නැදිගේ රසික ප්‍රියංග පීරිස් වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 10අ(1)(අ) වැනි වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි.

රසික පීරිස්,
තේරීම්භාර නිලධාරී,
පානදුර ප්‍රාදේශීය සභාව.

2012 ජුලි මස 04 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
කළුතර.

07 - 595

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ බේරුවල ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

අවසරය ලබා නොගෙන මාස තුනක කාලසීමාවක් සභාවේ රැස්වීම්වලට සහභාගි නොවීම හේතු කොට ගෙන බේරුවල ප්‍රාදේශීය සභාවේ සභිකයෙකුගේ ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

වෙල්ලප්පුලි ආරච්චිගේ දොන් අජන්ත චානක නම් වූ සභිකයා අයත්වන ජනතා විමුක්ති පෙරමුණ නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් ඒ බේරුවල ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වශයෙන් තේරී පත්වීම සඳහා අඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තෙකු නාම යෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65අ(2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන පියල් බන්දුල කුමාර කළුතරගේ මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

බේරුවල ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී හැන්නැදිගේ රසික ප්‍රියංග පීරිස් වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, පියල් බන්දුල කුමාර කළුතරගේ මහතා බේරුවල ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

රසික පීරිස්,
තේරීම්භාර නිලධාරී,
බේරුවල ප්‍රාදේශීය සභාව.

2012 ජුනි මස 25 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
කළුතර.

07 - 596

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.